ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## ඉන්දියාව ශ්‍රී ලංකාවේ දුම්රිය යටිතල පහසුකම් ශක්තිමත් කරයි

2023 ජනවාරි 8 වන දින ප්‍රවාහන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය (කිලෝ මීටර 128) ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු මැදවච්චියේ දී උත්සවාකාරයෙන් ආරම්භ කළහ. දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ අනෙකුත් කටයුතු ද මෙහි දී සම්පූර්ණ කෙරෙනු ඇත. මෙම ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක ඇමරිකානු ඩොලර් මිලියන 318ක ණය පහසුකමක් යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 91.27ක වියදමකින් ඉන්දියාවේ රාජ්‍ය සමාගමක් වන IRCON විසින් සම්පූර්ණ කරනු ඇත. ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්ද, මුදල් රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ, මහාමාර්ග රාජ්‍ය අමාත්‍ය සිරිපාල ගම්ලත් සහ ප්‍රවාහන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

2. උත්සව අවස්ථාව ඇමතූ ප්‍රවාහන අමාත්‍යතුමා විශේෂයෙන්ම ප්‍රවාහන ක්ෂේත්‍රයට ඉන්දියාව ලබා දෙන සහයෝගය සම්බන්ධයෙන් සිය කෘතවේදීත්වය පළ කළේය.

පසුගිය වසර කිහිපය තුළ IRCON සමාගම විසින් ශ්‍රී ලංකාවේ සිදු කළ ව්‍යාපෘතීන් අගය කළ එතුමා දෙරට අතර දුම්රිය සහයෝගීතාවය තවදුරටත් ඉහළ නැංවිය යුතු යැයි පැවසීය.

3. ණය පහසුකම් 5ක් යටතේ ඉන්දියාව දුම්රිය ක්ෂේත්‍රය තුළ ඇමරිකානු ඩොලර් බිලියන 1කට අධික ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර ඇති බව මහ කොමසාරිස්තුමා මෙහිදී සඳහන් කළේය. මෙයට අමතරව, දැනට පවතින ණය පහසුකම් යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 180ක පමණ ව්‍යාපෘතීන් දැනට ක්‍රියාත්මක අවධියේ හෝ ඉදිරියේදී ක්‍රියාත්මක කරන අවධියේ පවතී. ශ්‍රී ලංකාවේ භාණ්ඩ සහ මගී ප්‍රවාහනය වැඩි දියුණු කිරීම හරහා ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ නැංවීමෙහි ලා දුම්රිය මාර්ග නවීකරණය කිරීමේ වැදගත්කම මහ කොමසාරිස්තුමා අවධාරණය කළේය. අභ්‍යන්තර වශයෙන් මෙන්ම දෙරටෙහිම ජනතාව උදෙසා ඉන්දියාව සමඟ වන්දනා ගමන්, සංචාරක කටයුතු, වෙළඳාම සහ ආර්ථික ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා සම්බන්ධකතාවය ශක්තිමත් කිරීමේ වැදගත්කම ද එතුමා අවධාරණය කළේය. හරිත සහ තිරසාර ප්‍රවාහන විසඳුම් හඳුන්වා දීම සඳහා ඉන්දියාව ශ්‍රී ලංකාව සමඟ කටයුතු කරනු ඇති බව එතුමා ප්‍රකාශ කළේය.

4. ශ්‍රී ලංකාවේ දිගු කාලීන සංවර්ධන සහකරුවකු වශයෙන් ඉන්දීය රජය සහනදායි ණය සහ ප්‍රදාන යටතේ දිවයින තුළ විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාවට නංවා ඇත. මෙම මූල්‍ය පහසුකම් යටතේ ක්‍රියාත්මක විවිධ සහයෝගීතා අංශයන් අතරින් ශ්‍රී ලංකා දුම්රිය සේවය ප්‍රමුඛ ස්ථානයක් හිමි කර ගනී. IRCON ශ්‍රී ලංකාවේ සිය මෙහෙයුම් කටයුතු 2009 මාර්තු මස ආරම්භ කළ

අතර උතුරු පළාතේ සමස්ත දුම්රිය මාර්ග ජාලය (කිලෝ මීටර් 253) යළි ගොඩ නගමින් සහ දකුණු දුම්රිය මාර්ගය (කිලෝ මීටර් 115) ප්‍රතිසංස්කරණය කරමින් ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ග නවීකරණය සඳහා දායකත්වය ලබා දී ඇත. එසේම, මෙම සමාගම කිලෝ මීටර් 330ක දුම්රිය මාර්ගයක නවීන සංඥා සහ විදුලි සංදේශ පද්ධතියක් හරහා සුරක්ෂිතතාවය සහ විශ්වාසනීයත්වය සහතික කිරීමට ද දායක වී ඇත.

5. 2022 අප්‍රේල් මාසයෙන් පසුව ද ඉන්දියාව විසින් විවිධ ණය පහසුකම් හරහා ශ්‍රී ලංකාවට අඛණ්ඩව සහයෝගය ලබා දී ඇත. ණය පහසුකමක් යටතේ සපයන ඉන්දියාවේ නිෂ්පාදිත මහින්ද්‍රා SUV ජීප් රථ 500න් 125ක් මෑතක දී ශ්‍රී ලංකා පොලිසිය වෙත භාර දෙන ලදී. එසේම, ණය පහසුකමක් යටතේ ලබා දෙන අශෝක් ලේලන්ඩ් බස් 500න් 75ක් ද පසුගිය සතියේ දී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත බාර දෙන ලදී.

***

**කොළඹ**
**2023 ජනවාරි 10**